නිදහස් මාධ්‍ය ව්‍යාපාරය
சுதந்திர ஊடக இயக்கம்
FMM SRI LANKA Free Media Movement

# මාධ්‍ය නිදහස: නිරීක්ෂණ වාර්තාව
## ஊடக சுதந்திரம்: கண்காணிப்பு அறிக்கை
## Media Freedom Rights Monitoring Report


MFRMD

2025 අප්‍රේල්

6 වන වෙළුම - කලාප අංක 04



ඊශ්‍රායලයට එරෙහිව ස්ටිකරයක් ඇලවූ තරුණයකු ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ ...


ඔන්ලයින් පනත අහෝසි කිරීමේ නව පනත් කෙටුම්පත ගැසට් කිරීම


මාධ්‍යවේදී ෆසීර්ගේ රාජකාරියට පොලිසිය බාධා කිරීම ...

**මාධ්‍ය නිදහසට අදාළව ඒ ඒ මාසය තුළ වාර්තා වන සිදුවීම්, පූර්ව සිදුවීම්වල වර්ධනයන් හා ඒවාට අදාළ නිරීක්ෂණ මෙම වාර්තාවට ඇතුළත් වේ. මාධ්‍යවේදීන්ගේ මෙන්ම ජනතාවගේ භාෂණයේ හා අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය සම්බන්ධ සිදුවීම්, නව නීති පැනවීම්, නීති ප්‍රතිසංස්කරණ සහ අදාළ ප්‍රස්තුතයන් පිළිබඳව ජාතික හා ජාත්‍යන්තර වශයෙන් පළ වන ප්‍රතිචාර යනාදිය කෙරෙහිද මෙහිදී අවධානය යොමු කෙරේ.**

**මාධ්‍ය නිදහස පිළිබඳව නිරීක්ෂණය කිරීම සඳහා නිදහස් මාධ්‍ය ව්‍යාපාරය උපයෝගී කර ගන්නා විෂය පථයට/ සංරචකයන්ට අදාළ සිදුවීම් 27ක් 2025 අප්‍රේල් මාසයේදී නිරීක්ෂණය විය. ආරක්ෂාව හා සුරක්ෂිතබව යන සංරචකයට අයත් සිදුවීම් 10ක්, නීතිමය කොන්දේසි යන සංරචකය යටතට ගැනෙන සිදුවීම් 10 ක් සහ ව්‍යුහාත්මක කොන්දේසි යන සංරචකයට අදාළ සිදුවීම් 07ක් ඒ අතර වෙයි.**

## නිරීක්ෂණය වූ සිදුවීම්

01. උද්ඝෝෂණයක නිරතව සිටියදී අත්අඩංගුවට ගෙන රක්ෂිත බන්ධනාගාරගත කර සිටි ශිෂ්‍ය ක්‍රියාකාරිකයින් දෙදෙනකු ඇප මත මුදාහැරීම.
02. ඊශ්‍රායලයට එරෙහිව ස්ටිකරයක් ඇලවූ තරුණයකු ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට ගැනීමට එරෙහිව පොලිස් මූලස්ථානය ඉදිරිපිට විරෝධතාවක් පැවැත්වීම.
03. අත්අඩංගුවට ගත් මොහොමඩ් රුෂ්ඩි නිදහස් කරන ලෙස ඉල්ලා උද්ඝෝෂණයක් පැවැත්වීම සම්බන්ධයෙන් මිෆ්ලාල් මවුලවි කොළඹ අපරාධ අංශයට (CCD) කැඳවා ප්‍රශ්න කිරීම.
04. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට ගෙන රඳවා සිටි මොහොමඩ් රුෂ්ඩි අධිකරණයෙන් ඇප මත මුදාහැරීම.
05. Fact Crescendo ආයතනයට එරෙහිව මාධ්‍යවේදී නිරෝෂ් මෛත්‍රී එන්තරවාසියක් යොමු කිරීම.
06. මැතිවරණ විකාශන කටයුතු සඳහා අය කරන ගාස්තු ඉහළ දැමීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විද්‍යුත් විකාශකයින්ගේ සංගමය විරෝධය පළ කිරීම.
07. අධිකරණයට අපහාස කිරීම පිළිබඳ පනත ගැන නීතිඥ සංගමය කනස්සල්ල පළ කිරීම.

08. ඉන්දීය අගමැතිවරයා කොළඹ සංචාරයක නිරත වන අතරතුර ක්‍රියාකාරිකයින් පිරිසක් කොළඹදී පැවැත්වීමට සූදානම් කළ උද්ඝෝෂණයකට එරෙහිව අධිකරණය තහනම් නියෝගයක් පැනවීම.

09. විරෝධතාවක් අතරතුර අත්අඩංගුවට ගෙන රක්ෂිත බන්ධනාගාරගත කර සිටි අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලයේ කැඳවුම්කරු ඇතුළු දෙදෙනෙකු ඇප මත මුදාහැරීම.

10. 'ඔන්ලයින් පනත' අහෝසි කිරීම පිළිබඳ යෝජනාවක් පා.ම. රවී කරුණානායක පෞද්ගලික මන්ත්‍රී පනතක් ලෙස පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.

11. ඉන්දීය අගමැතිවරයාගේ සංචාරයේ අවස්ථා ආවරණය කිරීමට ශ්‍රී ලාංකීය මාධ්‍යවේදීන්ට අවස්ථාව අහිමි කිරීම.

12. සමාජ මාධ්‍ය ක්‍රියාකාරික ඕෂල හේරත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත කැඳවා ප්‍රශ්න කිරීම.

13. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත භාවිත කිරීම අත්හිටුවන ලෙසත්, එය අහෝසි කෙරෙන කාල රාමුවක් ප්‍රකාශ කරන ලෙසත් ඇම්නෙස්ටි ඉන්ටනැෂනල් ආයතන රජයෙන් ඉල්ලා සිටීම.

14. මාධ්‍යවේදී උපාලි ආනන්දගෙන් පොලිසිය තොරතුරු මූලාශ්‍ර පිළිබඳව ප්‍රශ්න කිරීම.

15. ත්‍රස්තවාදය වළැක්වීමේ පනත යටතේ රඳවාගෙන සිටි මොහොමඩ් රුෂ්ඩි අධිකරණය මගින් ඇප මත මුදාහැරීම.

16. අරගලය විරෝධතාවලට අදාළව නඩු පැවරුණු 3882 කට සහනයක් ඉල්ලා ජනපතිවරයාට ලිපියක් භාරදීම.

17. මව්බිම පුවත්පතේ පළ වූ ප්‍රවෘත්තියක් සම්බන්ධයෙන් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව නිවේදනයක් නිකුත් කිරීම.

18. රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ නිවේදනයට ප්‍රතිචාර දක්වමින්, මව්බිම පුවත්පත සිය ප්‍රවෘත්තිය යළි තහවුරු කිරීම.

19. ඔන්ලයින් පනත අහෝසි කිරීමේ නව පනත් කෙටුම්පත ගැසට් කිරීම.

20. විශ්‍රාමික මේජර් ජෙනරාල්වරයකුට මාධ්‍ය ඔස්සේ අපහාස කිරීම වළකමින් අධිකරණය තහනම් නියෝග යක් නිකුත් කිරීම.

21. තොරතුරු පනත අක්‍රිය වීමේ අවදානමක් සම්බන්ධයෙන් සාධාරණ සමාජයක් සඳහා වන ජාතික ව්‍යාපාරය අනතුරු ඇඟවීම.

22. කැබිනට් තීරණ දැනුම්දීමේ මාධ්‍ය සාකච්ඡාව සඳහා සූම් යෙදවුම ඔස්සේ සම්බන්ධ වන මාධ්‍යවේදීන්ට ප්‍රශ්න ඇසීමේ අවස්ථාව සීමා කිරීම.

23. ජාතික මාධ්‍ය ප්‍රතිපත්තිය පිළිබඳ සාකච්ඡාවක් ශ්‍රී ලංකා පුවත්පත් ආයතනයේ මෙහෙයවීමෙන් පැවැත්වීම.

24. අධිකරණ වාර්තාකරණයේ නිරතව සිටියදී මාධ්‍යවේදී ෆසීර්ගේ රාජකාරියට පොලිසිය බාධා කිරීම.

25. වෘත්තීය සමිති හා සංවිධාන ක්‍රියාකාරිකයින් 4 දෙනෙකුට එරෙහිව අධිකරණයෙන් තහනම් නියෝගයක් නිකුත් කිරීම.

26. කැබිනට් මාධ්‍ය හමුවට සහභාගි වීම, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ හැඳුනුම්පත හිමි මාධ්‍යවේදීන්ට පමණක් සීමා කිරීමට රජය තීරණය කිරීම.

25. ජනමාධ්‍ය හැඳුනුම්පත අනිවාර්ය කිරීමේ තීරණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා වෘත්තීය ජනමාධ්‍යවේදීන්ගේ සංවිධානය විරෝධය පළ කිරීම.

**1 වගුව: වාර්තා වූ සමස්ත සිදුවීම්- 2025 අප්‍රේල්**

| ආවරණය කර ඇති සංරචකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| ආරක්ෂාව සහ සුරක්ෂිතබව | 10 |
| නීතිමය කොන්දේසි | 10 |
| ව්‍යුහාත්මක කොන්දේසි | 07 |
| **එකතුව** | **25** |

## ආරක්ෂාව සහ සුරක්ෂිතබව

මාධ්‍යවේදීන්ට තම වෘත්තිය ශාරීරික සහ මානසික ඒකාග්‍රතාවකින් යුක්තව නිදහස් ලෙස කර ගෙන යෑමේ වාතාවරණයක් පැවතීම ජනමාධ්‍ය නිදහස පිළිබඳ මූලික කොන්දේසියකි. එමෙන්ම ජනමාධ්‍ය නිදහස හා අදහස් පළ කිරීමේ නිදහස ආරක්ෂා වීමට නම්, පුරවැසියන්ටද අනිටු ප්‍රතිවිපාකවලට මුහුණදීමේ අවදානමකින් තොරව ජනමාධ්‍ය ඔස්සේ හෝ වෙනත් ආකාරවලින් නිදහසේ අදහස් පළ කළ හැකි වාතාවරණයක් පැවතිය යුතුය. අනෙක් අතට, මාධ්‍ය වාර්තාකරණය හේතුවෙන් අගතියට ලක් නොවීමද පුරවැසියන්ගේ අයිතියකි. සාමාකාමීව රැස්වීමේ, විරෝධය පළ කිරීමේ හා උද්ඝෝෂණවල නිරත වීමේ නිදහසද අදහස් පළ කිරීමේ නිදහසට අයත් වේ. මෙම විෂයපථය යටතට ගැනෙන සිදුවීම් 10ක් අප්‍රේල් මාසයේදී නිරීක්ෂණය විය.

**2 වගුව: 2025 අප්‍රේල් : ආරක්ෂාව සහ සුරක්ෂිතබව- සිදුවීම් 10**

| දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| පහරදීම්/තර්ජන | - |
| බාධා කිරීම්/නිදහස සීමා කිරීම් | 04 |
| මානසික හා වෙනත් බලපෑම් | 06 |
| **එකතුව** | **10** |

01. **අත්අඩංගුවට ගත් මොහොමඩ් රුෂ්ඩි නිදහස් කරන ලෙස ඉල්ලා උද්ඝෝෂණයක් පැවැත්වීම සම්බන්ධයෙන් මිෆ්ලාල් මවුලවි කොළඹ අපරාධ අංශයට (CCD) කැඳවා ප්‍රශ්න කිරීම.**

කොළඹ පොලිස් මූලස්ථානය ඉදිරිපිට පැවැත්වූ උද්ඝෝෂණයෙන් අනතුරුව, එම විරෝධතාව සංවිධානය කළ මිෆ්ලාල් මවුලවි කොළඹ අපරාධ අංශයට (CCD) කැඳවා ප්‍රශ්න කොට ඇති බවත්, සෝදිසි කිරීම සඳහා මවුලවිවරයාගේ නිවසට ඔහු රැගෙන ගිය බවත් නීතිඥ හෙජාස් හිස්බුල්ලා ප්‍රකාශ කරයි. මොහොමඩ් රුෂ්ඩි අත්අඩංගුවට ගැනීම හා ඊට එරෙහි උද්ඝෝෂණයට දැක්වූ ප්‍රතිචාරය සම්බන්ධයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රී මුජිබර් රහ්මාන් රජයේ ස්ථාවරය ප්‍රශ්න කළේය.

මූලාශ්‍ර - https://shorturl.at/XJ96J

02. **Fact Crescendo ආයතනයට එරෙහිව මාධ්‍යවේදී නිරෝෂ් මෛත්‍රී එන්තරවාසියක් යොමු කිරීම.**

Factcrescendo - Sri Lanka විසින් සිදු කළ ව්‍යාජ කරුණු තහවුරු කිරීමක් මගින් තමාට සිදු වූ පෞද්ගලික හානියට රුපියල් කෝටි 10 ක වන්දියක් ඉල්ලා News 19 වෙබ් අඩවියේ ප්‍රධාන සංස්කාරක මාධ්‍යවේදී නිරෝෂ් මෛත්‍රී, Crescendo Transcription Pvt Ltd වෙත සිය නීතිඥවරු මගින් එන්තරවාසියක් යොමු කර තිබේ.

ජනාධිපති අනුර කුමාර දිසානායකගේ නිල දමිළ මාධ්‍ය ෆේස්බුක් ගිණුමෙහි පළ කර පසුව ඉවත් කරන ලද පෝස්ටුවක් සම්බන්ධයෙන් නිරෝෂ් මෛත්‍රී, සිය ෆේස් බුක් ගිණුමේ විචාරාත්මක සටහනක් සමග පළ කළ 'ස්ක්‍රීන් ශොට් එකක් 'ව්‍යාජ ලෙස සංස්කරණය කරන ලද්දක්' ලෙස හැඳින්වීම සහ එහි සත්‍යතාවය තහවුරු කිරීමකින් තොරව එය අසත්‍ය බවට ලේබල් කිරීමට කටයුතු කිරීම මෙම ප්‍රතිචාරයට නිමිති වී තිබේ.

මූලාශ්‍ර - https://shorturl.at/wSHYV

03. **ඉන්දීය අගමැතිවරයාගේ සංචාරයේ අවස්ථා ආවරණය කිරීමට ශ්‍රී ලාංකීය මාධ්‍යවේදීන්ට අවස්ථාව අහිමි කිරීම.**

ඉන්දීය අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදිගේ සංචාරය ආවරණය කිරීමේ අවස්ථාව මෙරට මාධ්‍ය වෙත නොදෙමින් ජනාධිපති මාධ්‍ය අංශයට එම ආවරණ කටයුතු සීමා කිරීම මාධ්‍යවේදීන්ගේ විරෝධයට හේතු වී තිබේ. දේශීය මාධ්‍යය වෙත ප්‍රවේශය ලබා දී තිබුණේ නිදහස් චතුරශ්‍රයේ පැවති පිළිගැනීමේ උත්සවය ආවරණය කිරීමට පමණක් වන අතර නායකයින් දෙදෙනාගේ ප්‍රකාශ සිදු කළ අවස්ථාවේදී දේශීය මාධ්‍ය අතුරින් එය ආවරණය කිරීමට අවස්ථාව ලබා දී තිබුණේ ජාතික රූපවාහිනියට පමණි.

මෙම පියවර නිසා වාර්තාකරණයේදී මෙරට මාධ්‍යයන්ට යම් යම් ප්‍රමාදයන්ට මුහුණදීමට සිදු වූ අතර ජනාධිපති මාධ්‍ය අංශයෙන් තොරතුරු ලැබීමට පෙර ඉන්දීය මාධ්‍ය එම තොරතුරු වාර්තා කර තිබූ බවත් ජනාධිපති මාධ්‍ය අංශයෙන් ලැබීමට පැය කිහිපයකට පෙර ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලයේ ප්‍රවෘත්ති නිවේදන මෙරට මාධ්‍ය වෙත ලැබුණ බවත් මාධ්‍යවේදීහු ප්‍රකාශ කරති.

මූලාශ්‍ර - https://shorturl.at/rvkqI

04. **සමාජ මාධ්‍ය ක්‍රියාකාරික ඕෂල හේරත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත කැඳවා ප්‍රශ්න කිරීම.**

ප්‍රකට සමාජ මාධ්‍ය ක්‍රියාකාරිකයකු වන ඕෂල හේරත් අප්‍රෙල් 05 වැනිදා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවා කට උත්තරයක් ලබාගෙන ඇත. 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ XI වන පරිච්ඡේදයේ ප්‍රතිපාදන ප්‍රකාරව මහජන ආරක්ෂාව හා ජාතික සාමයට බලපාන කරුණක් සම්බන්ධයෙන් පවත්වන පරීක්ෂණයකට අදාළව ඔහුගෙන් තොරතුරු ලබා ගැනීම සඳහා මෙම කැඳවීම සිදු කර තිබේ.

'එම පරීක්ෂණයට අදාළව අවස්ථාගත කරුණු ඕෂල හේරත් දන්නා බවට තොරතුරු අනාවරණය වී ඇති බැවින්' අපරාධ

පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැමිණ පෙනී සිටින ලෙස අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඕෂල හේරත් වෙත දැනුම් දී තිබිණ.

මූලාශ්‍ර - https://shorturl.at/Z2oir

05. **මාධ්‍යවේදී උපාලි ආනන්දගෙන් පොලිසිය තොරතුරු මූලාශ්‍ර පිළිබඳව ප්‍රශ්න කිරීම.**

අනුරාධපුරේ වෛද්‍යවරියක ලිංගික අපරාධයකට ලක්වීමට අදාළව අධිකරණයට ඉදිරිපත් කළ බී වාර්තාව තමන්ට ලැබුණු ආකාරය පිළිබඳව අනුරාධපුර පොලිසිය, අධිකරණ වාර්තාකරුවකු වන උපාලි ආනන්දගෙන් ප්‍රශ්න කර තිබේ. තොරතුරු මූලාශ්‍ර ආරක්ෂා කිරීමට මාධ්‍යවේදියකු ආචාරධාර්මිකව බැඳී සිටින බවත්, ඒ සඳහා නෛතික රැකවරණයක්ද පවතින බවත් මාධ්‍යවේදියා ප්‍රකාශ කර ඇති අතර අදාළ නඩුවට ඉදිරිපත් කළ මෝසමක් මගින් ඒ සම්බන්ධයෙන් අධිකරණය හමුවේද කරුණු ඉදිරිපත් කර තිබේ. මාධ්‍යවේදියා වගකීම්සහගතව වාර්තාකරණය සිදු කර ඇති බවත්, පොලිසියේ මෙම ක්‍රියාව මාධ්‍ය නිදහස සම්බන්ධයෙන් බරපතළ තත්ත්වයක් බවත් නිදහස් මාධ්‍ය ව්‍යාපාරය ප්‍රකාශ කරයි.

මූලාශ්‍ර - බීබීසී සිංහල

06. **මව්බිම පුවත්පතේ පළ වූ ප්‍රවෘත්තියක් සම්බන්ධයෙන් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව නිවේදනයක් නිකුත් කිරීම.**

මැතිවරණ නීති උල්ලංඝනය වන පරිදි සිදු කළ ප්‍රකාශයක් සම්බන්ධයෙන්, මැතිවරණ කොමිසම ජනාධිපතිවරයා වෙත ලිපියක් යවා ඇති බවට අප්‍රේල් 17 වැනිදා මව්බිම පුවත්පතේ පළ වූ ප්‍රවෘත්තියක් සම්බන්ධයෙන් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව මෙම නිවේදනය නිකුත් කර තිබේ. ආණ්ඩු පක්ෂයට බහුතරය නොලැබෙන පළාත් පාලන ආයතනවලට ප්‍රතිපාදන ලබා නොදෙන බවට ජනාධිපතිවරයා විසින් කරන ලදැයි කියන ප්‍රකාශයක් සම්බන්ධයෙන් මැතිවරණ කොමිසම ජනාධිපතිවරයා වෙත ලිඛිතව ප්‍රතිචාර දක්වා ඇතැයි අදාළ පුවතෙහි සඳහන් විය. එහෙත් ප්‍රවෘත්ති වාර්තාවේ සඳහන් පාර්ශවයන්ගෙන් කරන ලද විමසීම්වලින් පසුව, එම පුවත අසත්‍ය බව සොයාගෙන ඇති බව රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව පවසයි.

මූලාශ්‍ර - https://short-link.me/-HRv

07. **රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ නිවේදනයට ප්‍රතිචාර දක්වමින්, මව්බිම පුවත්පත සිය ප්‍රවෘත්තිය යළි තහවුරු කිරීම.**

මැතිවරණ නීති උල්ලංඝනයක් කිරීමක් සම්බන්ධයෙන් මැතිවරණ කොමිසම ජනාධිපති ලේකම්වරයාට ලිපියක් යොමු කළ බවට අප්‍රේල් 17 වැනිදා සිය පුවත්පත පළ කළ පුවත කොමිසමේ මූලාශ්‍රයක් මගින් සනාථ කළ එකක් බවත්, එය ප්‍රධාන පුවත හැටියට වාර්තා කිරීමෙන් පසු එහි සභාපතිවරයා විසින්ම එම තොරතුර ප්‍රතික්ෂේප කරනු ලැබීම විමතියට කරුණක් බවත් 'මව්බිම් පුවත්පත සඳහන් කරයි. මෙසේ කොමිසම පැය විසි හතරක් ඇතුළත ස්ථාවර දෙකක් ගැනීම ගැන 'මව්බිම් සිය අප්‍රසාදය පළ කරමින් මැතිවරණ කොමිසමට හා රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්වරයාට ලිපි යොමු කර ඇත.

මූලාශ්‍ර - https://short-link.me/-HRO

08. **කැබිනට් තීරණ දැනුම්දීමේ මාධ්‍ය සාකච්ඡාව සඳහා සූම් යෙදවුම ඔස්සේ සම්බන්ධ වන මාධ්‍යවේදීන්ට ප්‍රශ්න ඇසීමේ අවස්ථාව සීමා කිරීම.**

කැබිනට් මණ්ඩල තීරණ දැනුම් දීමේ ප්‍රවෘත්ති සාකච්ඡාවට සූම් යෙදවුම ඔස්සේ සම්බන්ධ වීමේ අවස්ථාව මාධ්‍යවේදීන්ට ලබා නොදෙන තත්ත්වයක් නිර්මාණය වී ඇතැයි මාධ්‍යවේදීහු චෝදනා කරති. ඒ සම්බන්ධයෙන් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ස්ථාවරය පිළිබඳව අප්‍රේල් 22 වැනිදා මාර්ගගත ක්‍රමයට සම්බන්ධ වූ මාධ්‍යවේදීන් ප්‍රශ්න කර ඇති අතර ඊට නිසි පිළිතුරක් ලැබී නැත. මෙම තත්ත්වය ජනාධිපතිවරයා ඇතුළු නව රජය ප්‍රකාශ කළ ඩිජිටල් රාජ්‍යකරණය සහ සම්බර තොරතුරු වාර්තාකරණය පිළිබඳ ප්‍රතිපත්තිවලට පටහැනි බව මාධ්‍යවේදී මිතුන් ජයවර්ධන පෙන්වා දෙයි..

මූලාශ්‍ර - https://short-link.me/13MiL

09. **අධිකරණ වාර්තාකරණයේ නිරතව සිටියදී මාධ්‍යවේදී ෆසීර්ගේ රාජකාරියට පොලිසිය බාධා කිරීම..**

තරුණ ජනමාධ්‍යවේදීන්ගේ සංගමයේ ලේකම්වරයා සහ සටහන් ආයතනයේ වාර්තාකරුවෙකු වන ෆසීර් මොහොමඩ්

කුලියාපිටිය මහේස්ත්‍රාත් අධිකරණයේ වාර්තාකරණයේ යෙදෙමින් සිටියදී එහි සේවය කරන පොලිස් නිලධාරීන් විසින් ඔහුගේ වාර්තාකරණයට බාධා කරමින් උසාවි ශාලාවෙන් පිටතට ඇද දමා තිබේ.

මෙයට පාදක වී ඇත්තේ සටහන් වෙබ් අඩවිය පසුගිය සතියේ වාර්තා කළ පොලිස් වධහිංසාවකට අදාළ නඩුවක් බවත්, එම නඩුවට සම්බන්ධ පොලිස් නිලධාරීන් පිළිබඳ මාධ්‍යවේදී ෆසීර් මොහොමඩ් සටහන් ආයතනයේ වාර්තාකරණයේදී කරුණු හෙළිදරව් කළ බවත් සටහන් මාධ්‍ය ආයතනය ප්‍රකාශ කරයි.

මූලාශ්‍ර - https://short-link.me/-HSs

10. **කැබිනට් මාධ්‍ය හමුවට සහභාගි වීම, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ හැඳුනුම්පත හිමි මාධ්‍යවේදීන්ට පමණක් සීමා කිරීමට රජය තීරණය කිරීම.**

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව මේ වසර සඳහා නිකුත් කර ඇති හැඳුනුම්පත සහිත මාධ්‍යවේදීන්ට පමණක් කැබිනට් මාධ්‍ය හමුවට සහභාගි විය හැකි බව කැබිනට් මාධ්‍ය ප්‍රකාශක, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍ය වෛද්‍ය නලින්ද ජයතිස්ස ප්‍රකාශ කරයි. එමෙන්ම කැබිනට් මණ්ඩල තීරණ දැනුම් දීමටත් කැබිනට් පත්‍රිකා මත පදනම් වූ ප්‍රශ්න සහ අත්‍යවශ්‍ය ප්‍රශ්න කිහිපයක් සඳහා පමණක් පිළිතුරු දීමට පමණක් කැබිනට් මාධ්‍ය ප්‍රකාශකවරයා ලෙස තමන් මාධ්‍ය හමුව සඳහා පැමිණි බවත් අමාත්‍ය ජයතිස්ස වැඩිදුරටත් ප්‍රකාශ කරයි. අප්‍රේල් 29 වැනිදා කැබිනට් තීරණ දැනුම් දීමේ මාධ්‍ය හමුවේදී ඔහු මේ බව ප්‍රකාශ කළේය.

මූලාශ්‍ර - https://short-link.me/-HSI

## නීතිමය කොන්දේසි

**මාධ්‍ය නිදහසට අදාළව නීතිමය කොන්දේසි පිළිබඳ සංරචකය යටතට ගැනෙන සිදුවීම් 10ක් අප්‍රේල් මාසය තුළ නිරීක්ෂණය විය. නීතිමය ක්‍රියාමාර්ග, පෙර සිදුවීම්වල වර්ධනයන් මෙන්ම නීති ප්‍රතිසංස්කරණ යන දර්ශක යටතට ගැනෙන සිදුවීම්ද ඊට ඇතුළත්ය.**

**3 වගුව: 2025 අප්‍රේල් : නීතිමය කොන්දේසි- සිදුවීම් 10**

| දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| නීතිමය ක්‍රියාමාර්ග | 07 |
| නීති ප්‍රතිසංස්කරණ | 03 |
| මාධ්‍යවේදීන්ට එරෙහි අපරාධ සඳහා දණ්ඩමුක්තිය | - |
| **එකතුව** | **10** |

01. **උද්ඝෝෂණයක නිරතව සිටියදී අත්අඩංගුවට ගෙන රක්ෂිත බන්ධනාගාරගත කර සිටි ශිෂ්‍ය ක්‍රියාකාරිකයින් දෙදෙනකු ඇප මත මුදාහැරීම.**

මාර්තු 28 වැනිදා සෞඛ්‍ය අමාත්‍යාංශය ඉදිරිපිට උද්ඝෝෂණ පැවැත්වීම වළක්වමින් මාලිගාකන්ද මහේස්ත්‍රාත්වරයා නිකුත් කළ නියෝගය කඩ කිරීමේ චෝදනාව මත අත්අඩංගුවට ගැනුණු අන්තර් විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය බල මණ්ඩලයේ කැඳවුම්කරු මධුෂාන් චන්ද්‍රජිත් සහ සම සෞඛ්‍ය විද්‍යා උපාධිධාරී එකමුතුවේ ලේකම්වරයා අප්‍රේල් 04 වැනිදා මෙලෙස ඇප මත මුදාහැරිණි. එම උද්ඝෝෂණයේදී ශිෂ්‍ය ක්‍රියාකාරිකයින් 27 දෙනෙකු අත්අඩංගුවට ගැනුණු අතර සෙසු අයට මීට පෙර ඇප නියම විය.

මූලාශ්‍ර - https://short-link.me/13Mkt

02. **ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට ගෙන රඳවා සිටි මොහොමඩ් රුෂ්ඩි අධිකරණයෙන් ඇප මත මුදාහැරීම.**

ගාසා තීරයේ ඊශ්‍රායල හමුදා ක්‍රියාමාර්ග හෙළා දකින ස්ටිකරයක් ඇලවූ බවට චෝදනා කරමින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA) යටතේ මාර්තු 22 වැනිදා ත්‍රස්ත විමර්ශන අංශය මගින් අත්අඩංගුවට ගත් අතර ආරක්ෂක ඇමතිවරයා ලෙස ජනාධිපතිවරයාගේ අත්සනින් යුතුව නිකුත් කළ මාස 3ක රැඳවුම් නියෝගයක් මත රඳවා තැබිණි. අප්‍රේල් 07 වැනිදා අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු ඔහු ඇප මත නිදහස් කර තිබේ. අහෝසි කරන බවට රජය පොරොන්දු වී ඇති

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිදු කළ මෙම අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් ඇම්නෙස්ටි ඉන්ටනැෂනල් සංවිධානයද රජය වෙත කනස්සල්ල පළ කර තිබිණි.

මූලාශ්‍ර - https://short-link.me/-HUc

03. **අධිකරණයට අපහාස කිරීම පිළිබඳ පනත ගැන නීතිඥ සංගමය කනස්සල්ල පළ කිරීම.**

2024 අංක 8 දරන අධිකරණයකට, විනිශ්චය සභාවකට හෝ ආයතනයකට අපහාස කිරීම පිළිබඳ පනත සම්බන්ධයෙන් කනස්සල්ල පළ කරන අතර, ඒ සම්බන්ධයෙන් ගත යුතු පියවර පිළිබඳව සාකච්ඡා කරමින් සිටින බව ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ සභාපති නීතිඥ රජීව් අමරසූරිය ප්‍රකාශ කරයි.

මාර්තු 28 වැනි දින සිදුවීමකින් පසු පුත්තලම මහාධිකරණ විනිසුරු නදී අපර්ණා සුවඳුරුගොඩ විසින් අධිකරණයට අපහාස කිරීමේ චෝදනාව මත පී. උදයංගනී නම් නීතිඥවරිය රක්ෂිත බන්ධනාගාරගත කිරීමේ සිද්ධිය පිළිබඳව themorning පුවත්පතට අදහස් පළ කරමින්, සභාපතිවරයා ප්‍රකාශ කර ඇත්තේ අදාළ පනත කුරිරු නීතියක් බවයි.

අධිකරණයට ඇතුළුවීමේදී හිස නවා ගෞරව කිරීමට අපොහොසත් වීම සහ මාර්තු 7 වැනි දින චූදිතයකු වෙනුවෙන් පෙනී සිටියදී නිසි ගෞරවයකින් තොරව අධිකරණයට කතා කිරීම යන චෝදනා මත අදාළ නීතිඥවරිය රක්ෂිත බන්ධනාගාරගත කෙරුණු අතර පසුව නීතිඥ අමරසූරිය විසින් ගොනු කරන ලද රිට් අයදුම්පතක් සලකා බලමින්, අභියාචනාධිකරණය නීතිඥවරිය නිදහස් කිරීමට නියෝග කළේය.

මූලාශ්‍ර - https://short-link.me/-HVe

04. **ඉන්දීය අගමැතිවරයා කොළඹ සංචාරයක නිරත වන අතරතුර ක්‍රියාකාරිකයින් පිරිසක් කොළඹදී පැවැත්වීමට සූදානම් කළ උද්ඝෝෂණයකට එරෙහිව අධිකරණය තහනම් නියෝගයක් පැනවීම.**

පෙරටුගාමී සමාජවාදී පක්ෂය සහ අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලය විසින් සැලසුම් කළ විරෝධතාවක් සම්බන්ධයෙන් පොලිසිය කළ දැනුම්දීමකට අනුව අධිකරණය මෙම නියෝගය නිකුත් කර තිබේ. විරෝධතාකරුවන්ට කොළඹ-කොටුව සහ ගාලු මුවදොර ප්‍රදේශවලට ඇතුළුවීම එමගින් තහනම් කර ඇත.

මූලාශ්‍ර - https://short-link.me/13Mm5

05. **විරෝධතාවක් අතරතුර අත්අඩංගුවට ගෙන රක්ෂිත බන්ධනාගාරගත කර සිටි අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලයේ කැඳවුම්කරු ඇතුළු දෙදෙනෙකු ඇප මත මුදාහැරීම.**

අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බලමණ්ඩලයේ කැඳවුම්කරු මධුෂාන් චන්ද්‍රජිත් සහ තවත් අයකු රුපියල් මිලියන 01 බැගින් වූ ශරීර ඇප 2ක් මත මුදාහැරීමට මාලිගාකන්ද මහේස්ත්‍රාත් අධිකරණය අප්‍රේල් 04 වැනිදා නියෝග කළේය. මාර්තු 28 වැනි දින අධිකරණ නියෝගයක් නොතකා සෞඛ්‍ය අමාත්‍යාංශය අසල පැවති විරෝධතාවක් අතරතුර ශිෂ්‍ය ක්‍රියාකාරීන් 27 දෙනෙකු අත්අඩංගුවට ගැනුණු අතර ඉන් 25 දෙනෙකු එදිනම ඇප මත මුදාහැරිණි.

**මූලාශ්‍ර** - https://short-link.me/13Mmk

06. **'ඔන්ලයින් පනත' අහෝසි කිරීම පිළිබඳ යෝජනාවක් පා.ම. රවී කරුණානායක පෞද්ගලික මන්ත්‍රී පනතක් ලෙස පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.**

ආන්දෝලනයට තුඩු දුන් මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ පනත (Online Safety Bill) සම්පූර්ණයෙන් ඉවත් කර ගැනීම සම්බන්ධයෙන් පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පතක් නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණේ පාර්ලිමේන්තු මන්ත්‍රී රවී කරුණානායක විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබ ඇත.

මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පත 2023 ජනවාරි මාසයේදී පාර්ලිමේන්තුවේදී වැඩි ඡන්දයෙන් සම්මත වූ අතර එය පළමුවරට පාර්ලිමේන්තුවට ඉදිරිපත් වූ අවස්ථාවේදී එහි ව්‍යවස්ථානුකූලභාවය ප්‍රශ්න කරමින් ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම් 47ක් ඉදිරිපත් කෙරිණ.

මූලාශ්‍ර - https://short-link.me/13Mov

07. **ත්‍රස්තවාදය වළැක්වීමේ පනත යටතේ රඳවාගෙන සිටි මොහොමඩ් රුෂ්ඩි අධිකරණය මගින් ඇප මත මුදාහැරීම.**

ඊශ්‍රායලයට එරෙහි ස්ටිකරයක් ඇලවීම හේතුවෙන් මාර්තු 22 වැනිදා අත්අඩංගුවට ගෙන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවාගෙන සිටි මොහොමඩ් රුෂ්ඩි අප්‍රේල් 07 දින අත්තනගල්ල මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කරන ලදුව නිදහස් කරන ලදි. 22හැවිරිදි රුෂ්ඩි අත්අඩංගුවට සම්බන්ධයෙන් මානව හිමිකම් ආරක්ෂකයින්ගේ දැඩි අවධානයට ලක් වූ අතර අදහස් මර්දනය හා අහෝසි කිරීමට ප්‍රතිඥා දී ඇති ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අවභාවිත කිරීම

සම්බන්ධයෙන් රජයට දැඩි විරෝධයක් එල්ල විය. රුෂ්ඩි අත්අඩංගුවට ගැනීම හුදෙක් ස්ටිකරයක් ඇලවීම නිසා සිදු කළ එකක් නොවන බවත්, ඔහු ත්‍රස්තවාදී ක්‍රියාවක් කිරීමට නැඹුරුවක් දක්වන පුද්ගලයකු බවට සාධාරණ සැකයක් ඇති බවත් පොලිසිය කියා සිටි නමුත් අධිකරණය ඉදිරියේ එම කරුණ සනාථ කිරීමට පොලිසිය අසමත්ව තිබේ.

මූලාශ්‍ර - https://short-link.me/-HY6
https://short-link.me/-HY8

08. **ඔන්ලයින් පනත අහෝසි කිරීමේ නව පනත් කෙටුම්පත ගැසට් කිරීම.**

මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ පනත් කෙටුම්පත (Online safety Act) අවලංගු කිරීම සඳහා වූ පනත් කෙටුම්පත පිළිබඳ ගැසට් නිවේදනය නිකුත් කරන ලදි. මෙම පනත් කෙටුම්පත, විපක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රී රවී කරුණායක විසින් පුද්ගලික මන්ත්‍රී යෝජනාවක් ලෙස මෙම කෙටුම්පත පාර්ලිමේන්තු මහලේකම්වරයා වෙත භාර දී තිබූ අතර ඒ අනුව අදාළ ගැසට් නිවේදනය නිකුත් කර තිබේ.

මූලාශ්‍ර - https://short-link.me/-HYR

09. **විශ්‍රාමික මේජර් ජෙනරාල්වරයකුට මාධ්‍ය ඔස්සේ අපහාස කිරීම වළකමින් අධිකරණය තහනම් නියෝගයක් නිකුත් කිරීම.**

විශ්‍රාමික මේජර් ජෙනරාල් අශෝක තෝරදෙණිය පිළිබඳව විද්‍යුත්, මුද්‍රිත සහ සමාජ මාධ්‍ය හරහා අසත්‍ය හා අපහාසාත්මක ප්‍රකාශ ප්‍රචාරය කිරීම වැළැක්වීම සඳහා කොළඹ අතිරේක මහේස්ත්‍රාත් අධිකරණය මෙම තහනම් නියෝගයක් නිකුත් කර තිබේ. රාහුබද්ධ කංකානම්ගේ ඉන්ද්‍රානන්ද ද සිල්වාට එරෙහිව නිකුත් කරන ලද මෙම නියෝගය අප්‍රේල් 30 වන දින දක්වා බලපැවැත්වේ. මේජර් ජෙනරාල් තෝරදෙණියගේ පැමිණිල්ලකට අනුව 2024 අංක 9 දරන මාර්ගගත ආරක්ෂණ පනතේ 24 වන වගන්තිය යටතේ මෙම නඩුව පවරා තිබේ. අදාළ ප්‍රකාශ මාර්ගගත ආරක්ෂණ පනතේ 24 සහ 12 වගන්ති උල්ලංඝනය කරන බැවින් මෙම ප්‍රකාශ තවදුරටත් ප්‍රචාරය කිරීම වැළැක්වීම සඳහා මෙම තහනම් නියෝගය ඉල්ලා තිබිණි.

මූලාශ්‍ර - https://short-link.me/-HZ4

10. **වෘත්තීය සමිති හා සංවිධාන ක්‍රියාකාරිකයින් 4 දෙනෙකුට එරෙහිව අධිකරණයෙන් තහනම් නියෝගයක් නිකුත් කිරීම.**

පරිපූරක වෘත්තීන්ගේ සේවාවට අයත් පාඨමාලාවන් සඳහා උපාධිධාරීන් බඳවා ගැනීමේ තරග විභාගයට පෙනී සිටින අයදුම්කරුවන්ට ඊට සහභාගී නොවන ලෙසට බලපෑම් කිරීම සඳහා අප්‍රේල් 27 වැනිදා විරෝධතාවයක් පැවැත්වීමට කටයුතු කරන බවට මරදාන පොලිස් ස්ථානාධිපතිවරයා මාළිගාකන්ද මහෙස්ත්‍රාත් අධිකරණයෙන් කරන ලද ඉල්ලීමකට අනුව මෙම නියෝගය නිකුත් කර තිබේ. ඒ අනුව, සම සෞඛ්‍ය විද්‍යා උපාධිධාරී එකමුතුවේ සම කැඳවුම්කරු එම්.එන්.එම් නුස්ට්‍රි, එම එකමුතුවේ ලේකම් නඳුන් දශරික හේවාපතිරණ, අන්තර් විශ්ව විද්‍යාලයීය ශිෂ්‍ය බල මණ්ඩලයේ කැඳවුම්කරු මධුෂාන් චන්ද්‍රජිත් සහ පරිපූරක වෛද්‍ය සේවා වෘත්තීය සමිති එකාබද්ධ බල මණ්ඩලයේ සභාපති රවී කුමුදේශ් යන අයට අදාළ දිනයෙහි විරෝධතා පැවැත්වීම පිළිබඳ කොන්දේසි ඇතුළත් මෙම නියෝගය පනවා තිබේ.

මූලාශ්‍ර - https://short-link.me/13Mq1

## ව්‍යුහාත්මක කොන්දේසි

**මාධ්‍ය පද්ධතියේ සමස්ත ව්‍යුහයට මෙන්ම මාධ්‍ය නිදහස සක්‍රිය කරන සමස්ත පරිසරයට අදාළ වන විභව දර්ශක 6ක් මෙම සංරචකයට ඇතුළත්ය. මේ අතුරින් 'අධීක්ෂණ කණ්ඩායම් මගින් මාධ්‍ය නිදහසට ක්‍රියාකාරී සහායී යන දර්ශකයට අදාළ එක් සිදුවීමක් අප්‍රේල් මාසයේදී නිරීක්ෂණය විය.**

**4 වගුව: 2025 අප්‍රේල් : ව්‍යුහාත්මක කොන්දේසි - සිදුවීම් 07**

| දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| අධීක්ෂණ කණ්ඩායම් මගින් මාධ්‍ය නිදහසට ක්‍රියාකාරී සහාය | 07 |
| **එකතුව** | **07** |

**01. ඊශ්‍රායලයට එරෙහිව ස්ටිකරයක් ඇලවූ තරුණයකු ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට ගැනීමට එරෙහිව පොලිස් මූලස්ථානය ඉදිරිපිට විරෝධතාවක් පැවැත්වීම.**

ඊශ්‍රායල හමුදා ක්‍රියාමාර්ග හෙළා දකිමින් ස්ටිකරයක් ඇලවූ බවට චෝදනා කරමින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA) යටතේ අත්අඩංගුවට ගත් 20 හැවිරිදි මොහොමඩ් රුෂ්ඩි නිදහස් කරන ලෙස ඉල්ලා සිවිල් ක්‍රියාකාරිකයින් පිරිසක් විසින් කොම්පඤ්ඤ වීදියේ පොලිස් මූලස්ථානය අසලදී මෙම විරෝධතාව පැවැත්විණි. අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය මර්දනය කිරීම සඳහා ත්‍රස්ත විරෝධී නීතිය අනිසි ලෙස භාවිත කිරීමට විරෝධය පළ කරමින් පලස්තීනයට සහාය පළ කෙරෙන ස්ටිකර් නගරය පුරා බෙදා හරින ලදි.

කොම්පඤ්ඤවීදිය ප්‍රදේශයේ ප්‍රසිද්ධ සාප්පු සංකීර්ණයක අලෙවිකරුවකු ලෙස සේවය කළ මෙම තරුණයා මාර්තු 22 වැනි දින අත්අඩංගුවට ගැනුණු අතර (PTA) යටතේ ආරක්ෂක ඇමතිවරයා ලෙස ජනාධිපතිවරයා විසින් අත්සන් තබන ලද රැඳවුම් නියෝගයක් මත ත්‍රස්ත විමර්ශන අංශයෙහි (TID) රඳවා ඇත.

මූලාශ්‍ර - https://short-link.me/-H-O

**02. මැතිවරණ විකාශන කටයුතු සඳහා අය කරන ගාස්තු ඉහළ දැමීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විද්‍යුත් විකාශකයින්ගේ සංගමය විරෝධය පළ කිරීම.**

මැතිවරණ කොමිසම මගින්, පසු ගිය වසරවල පැවැත්වූ ප්‍රධාන මැතිවරණ විකාශ කටයුතු සඳහා අය කළ ගාස්තු, මෙවර පළාත් පාලන මැතිවරණ විකාශන කටයුතු සඳහා සියයට 1300% කින් පමණ වැඩි කර ඇති බව ප්‍රකාශ කරන ශ්‍රී ලංකා විද්‍යුත් විකාශකයින්ගේ සංගමය, ඒ සම්බන්ධයෙන් විරෝධය පළ කරයි.

මැතිවරණ ප්‍රතිඵල විකාශයක් යනු මහජනතාවගේ තොරතුරු දැන ගැනීමේ අයිතිය තහවුරු කිරීමක් වන අතර, රූපවාහිනී හා ගුවන් විදුලි නාලිකා, මැතිවරණ විකාශ පවත්වා ගෙන යන්නේ එයින් ලාභයක් ලැබීමේ අරමුණින් නොවන බවත් අවධාරණය කරන එම සංගමය, ජාතික වැදගත්කමකින් යුත් වැඩසටහන් ප්‍රචාරය කිරීමේදී ඒ සඳහා වාණිජ මට්ටමින් මුදල් අය කිරීම ජාත්‍යන්තරව හෝ ශ්‍රී ලංකාවේ මෙතෙක් සිදු වී නොමැති බවද කියා සිටී. මැතිවරණ කොමිසමේ සභාපතිවරයා අමතමින් සංගමයේ සභාපති හා ලේකම්ගේ අත්සනින් යුත් ලිපියක් මගින් මෙම කරුණු පෙන්වා දී ඇත..

මූලාශ්‍ර - https://short-link.me/-I08

**03. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත භාවිත කිරීම අත්හිටුවන ලෙසත්, එය අහෝසි කෙරෙන කාල රාමුවක් ප්‍රකාශ කරන ලෙසත් ඇම්නෙස්ටි ඉන්ටනැෂනල් ආයතන රජයෙන් ඉල්ලා සිටීම.**

ඊශ්‍රායල විරෝධී ස්ටිකරයක් ඇලවීම හේතුවෙන් අත්අඩංගුවට ගත් 22 හැවිරිදි මොහොමඩ් රුස්ඩි ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවා තබාගැනීම සම්බන්ධයෙන් නිවේදනයක් නිකුත් කරමින් ඇම්නෙස්ටි ඉන්ටර්නැෂනල් ආයතනය ඒ බව අවධාරණය කර ඇත.

'දශක ගණනාවක් පුරා ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අනිසි ලෙස භාවිත කිරීමේ බලධාරීන්ගේ අතීත ක්‍රියාවලින් ඉවත් වීමට නම්, නව ශ්‍රී ලංකා රජය ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත පිළිබඳ ඔවුන්ගේ ස්ථාවරය තුළ කටයුතු කළ යුතු අතර, ත්‍රස්තවාදී වරදක් පිළිබඳ නීත්‍යානුකූල සැකයක් නොමැති අවස්ථාවක, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ විශාල බලතල භාවිත කිරීමෙන් සහ අනිසි ලෙස භාවිතා කිරීමෙන් වැළකී සිටීමට බලධාරීන්ට දැඩි මාර්ගෝපදේශ නිකුත් කළ යුතුය'යි එම සංවිධානය පෙන්වා දෙයි.

මූලාශ්‍ර - https://short-link.me/-I0I

https://short-link.me/13Mse

**04. අරගලය විරෝධතාවලට අදාළව නඩු පැවරුණු 3882කට සහනයක් ඉල්ලා ජනපතිවරයාට ලිපියක් භාරදීම.**

2022 අරගලය විරෝධතා ව්‍යාපාරයට සම්බන්ධ පුද්ගලයන් 3882 දෙනකුට විවිධ නීති නවයක් යටතේ චෝදනා ගොනුකර ඇති බැවින්, එලෙස චෝදනා එල්ල වී ඇති පුද්ගලයින්ට යුක්තිය ඉටුකරන ලෙස ඉල්ලා ජනාධිපති අනුර කුමාර දිසානායක වෙත ලිපියක් යොමු කර තිබේ.

සිවිල් සමාජ නියෝජිතයන් සහ නීතිඥවරුන්ගේ අත්සනින් යුතුව නිකුත් කර ඇති එම ලිපියෙන් පෙන්වාදෙන්නේ විරෝධතා ව්‍යාපාරයට අදාළව පරීක්ෂණ 709ක් සිදු කර ඇති අතරෙ, එමගින් පුද්ගලයන් දහස්ගණනක් අත්අඩංගුවට නඩු පවරා ඇති බවයි. විරෝධතා අතරතුර පුද්ගලයන් 11 දෙනකු ජීවිතක්ෂයට පත්වූ නමුත් වන්දි ලබා දී ඇත්තේ තෝරාගත් කිහිපදෙනෙකුට පමණක් බවද එමගින් පෙන්වා දී ඇත.

මූලාශ්‍ර - https://short-link.me/13MsI

05. **තොරතුරු පනත අක්‍රිය වීමේ අවදානමක් සම්බන්ධයෙන් සාධාරණ සමාජයක් සඳහා වන ජාතික ව්‍යාපාරය අනතුරු ඇඟවීම.**

තොරතුරු පනත අක්‍රිය වීමෙන් සමස්ත දූෂණ විරෝධී ක්‍රියාදාමයම අඩපණ වීමට ඉඩ ඇතැයි, සාධාරණ සමාජයක් සඳහා වන ජාතික ව්‍යාපාරය නිවේදනයක් නිකුත් කරමින් ප්‍රකාශ කළේය. එම ව්‍යාපාරයේ නායක, කරු ජයසූරිය මහතාගේ අත්සනින් අප්‍රේල් 21 වැනිදා නිකුත් කර ඇති එම මාධ්‍ය නිවේදනයේ වැඩි දුරටත් සඳහන් වන්නේ ශ්‍රී ලංකා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ පූර්ණ සක්‍රීයභාවය අඩපණ වන ආකාරයකට ඉඩප්‍රස්ථා විවර කර ඇති ආකාරයක් මේ වන විට උද්ගතව තිබීම ගැන නොපමාවම සැලකිල්ලට ගනිමින් තොරතුරු කොමිසමේ වර්තමාන පැවැත්ම ගැන බලධාරීන් වහාම සිය අවධානය යොමුකළ යුතුව ඇති බවයි.

මූලාශ්‍ර - https://short-link.me/-I1g

06. **ජාතික මාධ්‍ය ප්‍රතිපත්තිය පිළිබඳ සාකච්ඡාවක් ශ්‍රී ලංකා පුවත්පත් ආයතනයේ මෙහෙයවීමෙන් පැවැත්වීම.**

'යෝජිත ජාතික මාධ්‍ය ප්‍රතිපත්තිය සහ ශ්‍රී ලංකාවේ මාධ්‍ය ක්ෂේත්‍රයේ අනාගතයී යන්න තේමා කරගත් මෙම සාකච්ඡාව අප්‍රේල් 29 වැනිදා ශ්‍රී ලංකා පුවත්පත් ආයතන ශ්‍රවණාගාරයේදී පැවැත්විණි. ලෝක ජනමාධ්‍ය නිදහස් දිනය නිමිතිකරගෙන පැවැත්වුණු මෙම වැඩසටහන සඳහා ශ්‍රී ලංකා කතෘ සංසදය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය සහ ශ්‍රී ලංකා වෘත්තීය ජනමාධ්‍යවේදීන්ගේ සංගමයද සහාය විය.

මූලාශ්‍ර - https://short-link.me/-I1x

07. **ජනමාධ්‍ය හැඳුනුම්පත අනිවාර්ය කිරීමේ තීරණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා වෘත්තීය ජනමාධ්‍යවේදීන්ගේ සංවිධානය විරෝධය පළ කිරීම.**

කැබිනට් ප්‍රවෘත්ති සාකච්ඡාව ආවරණය කිරීම, ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ හැඳුනුම්පත සහිත මාධ්‍යවේදීන්ට පමණක් සීමා කිරීමට රජය ගෙන ඇති තීරණය සම්බන්ධයෙන් නිවේදනයක් නිකුත් කරන ශ්‍රී ලංකා වෘත්තීය ජනමාධ්‍යවේදීන්ගේ සංගමය, එම තීරණයට දැඩි විරෝධය පළ කරයි. මෙය රජයට හිලෑ මාධ්‍යවේදීන් පිරිස පමණක් මාධ්‍ය සාකච්ඡාවට කැඳවීමේ නීච උත්සාහයක් බවත්, මාධ්‍ය මර්දනය සඳහා පෙර පැවති රජයන් අනුගමනය කළ පිළිවෙතම අනුගමනය කිරීමක් බවත් ප්‍රකාශ කරන එම සංවිධානය, මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීම ස්වාධීන ව්‍යුහයක් වෙත පැවරිය යුතු බවද අවධාරණය කරයි.

මූලාශ්‍ර - https://short-link.me/-I1O

---

**5 වගුව: මාධ්‍ය නිදහස: 2025 ජනවාරි- අප්‍රේල් දක්වා නිදහස් මාධ්‍ය ව්‍යාපාරය වෙත වාර්තා වී ඇති සිදුවීම්.**

| **දර්ශකය** | **වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව** | | |
|---|---|---|---|
| ආවරණය කර ඇති සංරචකය | 2025 ජනවාරි - මාර්තු | | 2025 අප්‍රේල් |
| | නව සිදුවීම් | පෙර සිදුවීම්වල වර්ධනයන් | |
| ආරක්ෂාව හා සුරක්ෂිතබව | 25 | - | 10 |
| නීතිමය කොන්දේසි | 30 | 07 | 10 |
| මාධ්‍යයේ ස්වාධීනත්වය | - | - | - |
| වෘත්තීයවේදීත්වය | 11 | - | 08 |
| ව්‍යුහාත්මක කොන්දේසි | 04 | - | 07 |

**පසුසටහන:** සිවිල් සමාජ අපේක්ෂාවන්, ජාතික හා ජාත්‍යන්තර නඩු තීන්දු සහ අන්තර්ජාතික ප්‍රඥප්තීන්ටද අනුව යමින්, මාධ්‍ය නිදහස යනු මානව අයිතියක් ලෙස නිදහස් මාධ්‍ය ව්‍යාපාරය පිළිගනියි. සෑම තැනැත්තකුම සතු සිතීමේ නිදහස, හෘදය සාක්ෂියේ නිදහස සහ ආගමික නිදහස මෙන්ම අන් තැනැත්තන්ගේ මත දැනගැනීමට තිබෙන මූලික අයිතිය බාධාවකින් තොරව භුක්තිවිඳීම මානව අයිතියකි. මෙම පදනම මත පිහිටා මාධ්‍ය නිදහස යනු පහත දැක්වෙන දසවැදෑරුම් සංඝටකවල එකතුවක් ලෙස නිදහස් මාධ්‍ය ව්‍යාපාරය සලකයි. (1) සිතීමේ නිදහස (2) මතයක් දැරීමේ නිදහස (3) භාෂණයේ නිදහස (4) සාමකාමීව රැස්වීමේ නිදහස ඇතුළු අදහස් පළ කිරීමේ නිදහස (5) තොරතුරු දැනගැනීමේ නිදහස (6) ශ්‍රව්‍ය, දෘශ්‍ය පටිගත කිරීමේ සහ වාර්තා තබා ගැනීමේ නිදහස (7) ප්‍රකාශනයේ නිදහස (8) පුවත්පත් නිදහස (9) විද්‍යුත් මාධ්‍ය නිදහස (10) අන්තර්ජාල නිදහස යනු එම සංඝටකයන්ය. මෙම සංඝටක අතර ඇත්තේ සහජීවී සම්බන්ධයක් වන අතර එක් සංඝටකයක ඇති වන සීමාවක් මාධ්‍ය නිදහස පිළිබඳ අනෙක් සියලුම සංඝටකයන් භුක්තිවිඳීමේ නිදහස අහුරන බව නිදහස් මාධ්‍ය ව්‍යාපාරය පිළිග නියි. එමෙන්ම වගකීම් විරහිතව හා වෛරී සහගත ලෙස එම නිදහස භාවිත කිරීම යහපත් භාවිතාවක් නොවන බවද නිදහස් මාධ්‍ය ව්‍යාපාරය අවධාරණය කරයි.

මෙම මාසික වාර්තා පිළියෙල කරනු ලබන්නේ ජනමාධ්‍ය වාර්තා සහ නිදහස් මාධ්‍ය ව්‍යාපාරයට ලබා ගත හැකි තොරතුරු අනුව වැඩිදුර තොරතුරු සොයා එම සිදුවීම් විශ්ලේෂණය කිරීමෙනි. මෙම විශ්ලේෂණයේදී නිදහස් මාධ්‍ය ව්‍යාපාරය ඉහත කී දසවැදෑරුම් මාධ්‍ය නිදහස් සංඝටකයන් ආවරණය කරන ජාත්‍යන්තරව පිළිගත් සංරචකයන් හතක් ඔස්සේ තෝරා ගත් නිර්ණායක භාවිත කරයි.

Media Freedom Rights Monitoring Desk Supported by Program on Independent Journalism


## Free Media Movement

Convener: Hana Ibrahim +94 77 741 2995 | Secretary: Lasantha De Silva +94 71 166 7938, +94 77 810 7620
Treasurer: Thaha Muzammil +94 77 3741026 | Assistant Secretary: Niranjani Roland +94 760222798
No 96, Bernard Soysa Mw, Colombo 05. Tel: +94 112368895, Fax: +94 112368895
Web: www.fmmsrilanka.lk, www.mediareform.lk
Email: fmmsrilanka@gmail.com|Facebook: https://www.facebook.com/fmm.srilanka
Twitter: https://twitter.com/FMMsrilanka|#FMM25